## දිළිඳුකම පිටු දැකීම සඳහා වන සුළු පරිමාණ ණය - II ව්‍යාපෘතිය - 2012

-------------------------------------------------------------------------------

1. **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 3 ඡේදයෙහි දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ යෙන් ගිණුමෙන් ආපසු ගැනීම් සහ එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලැබූ පොත්පත් සහ වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව , සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම් සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණව විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණ බව , සහ ණය ගිවිසුමේ දක්වා ඇති මල්‍ය සම්මුතීන් වලට අනුකූල වූ බවත්ය.

2. **මූල්‍ය ප්‍රකාශන**

2:1 **මූල්‍ය කාර්ය සාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරුවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ආදායම සහ වියදම පිළිවෙලින් රු. 86,164,186 ක් සහ රු.75,192,019 ක් වූ අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ආදායම සහ වියදම

පිළිවෙලින් රු.84,198,850 ක් හා රු. 58,039,868 ක් විය.ව්‍යාපෘතියේ ආදායම් හා වියදම පිළිබඳ සාරාංශයක් ඉකුත් වර්ෂය සමග සසදා පහත දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | |
|---|---|---|
| | 2012 | 2011 |
| | රු. | රු. |
| ආදායම | 86,164,186 | 84,198,850 |
| අඩුකළා:වියදම | 75,192,019 | 58,039,868 |
| වියදමට වැඩි ආදායම | 10,909,948 | 26,158,982 |

## 2:2 විශේෂ යෙන් ගිණුම

ඉදිරිපත් කරන ලද තොරතුරු සහ මූල්‍ය ප්‍රකාශනවලට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යනු ලැබූ විශේෂ යෙන් ගිණුමට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී කරන ලද ගනුදෙනුවල සාරාංශයක් පහත දැක්වේ.

| | ජපන් යෙන් | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 71,164,186 | 104,390,744 |
| එකතු කළා: | | |
| ඌනපුරණය කිරීම් | 313,706,073 | 494,575,077 |
| විදේශ විනමය ලාභය | - | 2,693,795 |
| | 384,870,259 | 601,659,616 |
| අඩු කළා: ආපසු ගැනීම් | 384,870,259 | 601,659,616 |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | නැත | නැත |

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 ජනවාරි 01 දිනට විශේෂ යෙන් ගිණුමේ ඉදිරියට ගෙන එන ලද ශේෂය රු. 102,796,667 ක් විය.එසේ වුවත්, ශ්‍රී. ලං.ම.බැ. සකස් කරන ලද බැංකු ප්‍රකාශයට අනුව, ඊට අනුරූපී ශේෂය රු. 104,390,744 ක් විය. වෙනස වූ රු.1,594,077 හඳුනාගැනීමකින් තොරව විදේශ විනිමය ලාභ ගිණුමට ගලපා තිබුණි.

## 3. විගණන නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### 3.1 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය සඳහා වූ මෝටර් රථ ක්ෂය වැරදි ගණනය කිරීම් හේතුවෙන් රු.267,445 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 3.2 ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු

සමාලෝචිත වර්ෂය තුලදී ලබාදීමට සැලසුම් කළ ණය ගණන සහ ණය ප්‍රතිපාදනයන් ලහාකර ගත් තථ්‍ය ඉලක්කයන් සහ විචලනයන් අයවැය සමග සසඳා පහත වගුවෙන් දැක්වේ.

| පලාත | 2012 ඉලක්කය | | 2012 තථ්‍ය ප්‍රමාණය | | විචලනය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ණය ලබාදීම් ගණන | රු. මිලියන | ණය ලබාදීම් ගණන | රු. මිලියන | ණය ලබාදීම් ගණන | % | රු. මිලියන | % |
| උතුර | 14,740 | 725 | 2,554 | 194 | (12,186) | 82 | (531) | 73 |
| නැගෙනහිර | 3,435 | 179 | 4,909 | 295 | 1,474 | 43 | 116 | 64 |
| අනෙකුත් * | 5,850 | 346 | 2,653 | 163 | (3,197) | 54 | (183) | 53 |
| **එකතුව** | **24,025** | **1,250** | **10,116** | **652** | **(13,909)** | **58** | **(598)** | **48** |

* පුත්තලම, අනුරාධපුර, පොලොන්නරුව, බදුලල, මොණරාගල සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන් අනෙකුත් දිස්ත්‍රික්කවලට ඇතුළත් වේ.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ අරමුණු ලහාකරගැනීම සඳහා 24,025 ක ණය ලබාදීම් ප්‍රමාණයක් සහ රු. මිලියන 1,250 ක් පලාත් හා දිස්ත්‍රික්ක වල හඳුනාගත් ප්‍රතිලාභීන් වෙත ගෙවීමට සැලසුම් කර තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී 10,116 ක ණය ලබාදීම් ප්‍රමාණයක් හෙවත් සියයට 58 ක් සහ රු. මිලියන 652 ක් හෙවත් සියයට 48 ක් පමණක් ප්‍රතලාභීන්ට ලබාදී තිබුණි. මෙය ව්‍යාපෘතියේ දුර්වල ක්‍රියාකාර්ත්වය පෙන්නුම් කරයි.

(ආ) සමස්ත ණය ලබාදීමේ සැලසුම අතරින් ණය ලබාදීම් 14,740 ක් හෙවත් සියයට 61 ක් සහ රු. මිලියන 725 ක් හෙවත් සියයට 58 ක් උතුරු පළාතට ලබාදීමට සැලසුම්කර තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂය තුලද රු. මිලියන 194 ක් වූ ණය ලබාදීම් 2,554 ක් පමණක් ගෙවා තිබුණි. මෙය ප්‍රධාන වශයෙන්ම සිදුව තිබුණේ පළාතේ ප්‍රතිලාභින් පිළිබඳ කරන ලද වැරදි සහගත පුරෝකථනයන් හේතුවෙනි.

### 3.3 අරමුදල් උපයෝජනය සහ පවත්වාගෙනයාම

ණය ගිවිසුමේ 1 උපලේඛනයේ 2 වගන්තිය අනුව, 2008-2012 කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කරන ලද මුළු ප්‍රතිපාදනය ජපන් යෙන් මිලියන 2,525 ක් විය. එසේ වුවත් සමස්ත ව්‍යාපෘති කාලය තුල කරන ලද මුළු හැරගැනීම් ප්‍රමාණය ජපන් යෙන් මිලියන 2,038 ක් විය. මෙලෙස සමස්ත ප්‍රතිපාදනයෙන් කරන ලද මුළු හැරගැනීම් ප්‍රමාණය සියයට 81.71 ක් විය.

### 3.4 නීති,රීති,රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

ණය ගිවිසුමේ 4 උපලෙඛනයේ 4 වන වගන්තියෙන් නියම කර ඇති පරිදි සේවකයන් බඳවාගැනීමට සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ජ.ස.ජ.බැංකුවේ පූර්ව එකඟත්වය ලබානොගැනීම හේතුවෙන් , උපදේශන සහ ධාරිතා සංවර්ධන සංරචකය යටතේ ශ්‍රී.ලං.ම. බැ. විසින් ඉදිරිපත් කර තිබුණු ප්‍රතිපූරණ අයදුම්පත ජා.ස.ජ. බැංකුව විසින් හරවා එවා තිබුණි. උපදේශකයන් බඳවාගැනීම සඳහා පසුව අනුමැතිය ලබාදී තිබුණද, පුහුණුවීම් සහ දීමනා වෙනුවෙන් වැයකර තිබුණු රු. 5,797,684 ක් 2013 සැප්තැම්බර් අවසානය වන විට ජා.ස.ජ. බැංකුව මගින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

### 3.5 නොසැසඳු ශේෂයන්

මහජන බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණු ප්‍රතිමූල්‍ය ණය ශේෂයන් අතර සහ ඊට අනුරූපීව දායක වන මූල්‍ය ආයතන (දා.මු.ආ.) වල සනාථ කළ ශේෂයන් නොසැසඳීම හේතුවෙන් පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| දා.මු.ආ. | ගිණුම් අනුව ශේෂය | සනාථ කිරීම් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| මහජන බැංකුව | 291,626,950 | 266,348,966 | 25,277,984 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 270,003,950 | 280,297,581 | (10,293,631) |